www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදයේ ඓතිහාසික පරිහානිය හා මිලිටරිවාදයේ නැඟීම

## පලමු වන කොටස

**The historic decline of the United States and the eruption of militarism**
**Part one**

**නික් බීම්ස් විසිනි**
**2007 පෙබරවාරි 12**

*ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජික නික් බීම්ස් විසින් ජනවාරි 26 හා 27 යන දෙදින තුල පක්ෂ සාමාජිකත්වයට ඉදිරිපත් කල වාර්තාව පහත පල කෙරේ.*

යන්තම් දෙමසකට පෙර නොවැම්බර් 7 දින පැවැත්වූ කොන්ග්‍රස් සභා මධ්‍යවාර මැතිවරනයේ දී ඇමරිකානු ජනතාව, බුෂ් පාලනාධිකාරයේ යුද වැඩ පිලිවෙල ඉමහත් සේ ප්‍රතික්ෂේප කලහ. ඡන්ද වංචාවන් ද, දේශපාලන සංස්ථාපිතයේ කුමන කොටසක හෝ විරුද්ධත්වයකින් තොරව ද, බුෂ් පාලනාධිකාරයේ පූර්න හස්තයක් ලෙස ක්‍රියා කරන මාධ්‍ය මගින් ගෙන ගිය විකෘති කිරීම්, අර්ධ සත්‍යයන් හා බේගල්වල දෛනික ප්‍රචාරක ව්‍යාපාරය හමුවේ ලැබූ මෙම ප්‍රතිඵලය, ඉරාක යුද්ධය හා එමගින් පසු ගිය පස් වසරේ බුෂ් පාලන තන්ත්‍රයෙහි පදනම බවට පත්ව ඇති "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" සිත් කාවදින ලෙස ප්‍රතික්ෂේප කිරීමක් විය.

2006 ඡන්ද ප්‍රතිඵලය ජාත්‍යන්තර වැදගත්කමක් දරයි. ඇති තරම් පැහැදිලි ලෙස එමගින් පෙන්නුම් කලේ, නිරන්තරයෙන් මවා පාන චිත්‍රයට පටහැනිව ඇමරිකාව, ගැඹුරින්ම බෙදී ගිය සමාජයක් බවයි.

ඇමරිකානු අධිරාජ්‍යවාදය ද මිලිටරිවාදය ද නියෝජනය කරන බුෂ් තන්ත්‍රය, ලොව පුරා වෛරයට පාත්‍රව ඇති නමුත් වෙන කොතැනකදීටත් වඩා ඇමරිකාව තුල ම එය එසේ වන බව මැතිවරන ප්‍රතිඵලයෙන් පැහැදිලි කෙරෙයි. විරෝධතා ව්‍යාපාරය සෑම රටකම කම්කරු පන්තියට ප්‍රගාඪ ඇඟවුම් ගැබ්කර ගනියි.

සිව් වසරකට පෙර 2003 පෙබරවාරියේ දී ඉරාක ආක්‍රමනයට එරෙහිව පුපුරාගිය ජාත්‍යන්තර ව්‍යාපාරය මැතිවරන ප්‍රතිඵලය තුලින් එක්සත් ජනපදය තුල ප්‍රකාශයට පත් විය. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ද (හජාජාක) එහි සියලු ශාඛාවන්ද මුහුන දී සිටින ප්‍රධාන කර්තව්‍යය වන්නේ, 20 වන සියවස පිලිබඳ අපගේ ඓතිහාසික විශ්ලේෂනය ද, පසු ගිය සිව් වසරේ අත්දැකීම් ද උකහාගනිමින් මෙම ව්‍යාපාරය යලි පන ගැන්වීමට අවශ්‍ය න්‍යායික, දේශපාලනික හා ප්‍රායෝගික ආරම්භකත්වයන් වර්ධනය කිරීම යි.

නොවැම්බර් 7 මැතිවරනය ඇමරිකාවේ පුලුල් ජනසමූහයයේ ආකල්පය ප්‍රකාශකරන්නේ නම්, යන්තම් දෙමසකට පසුව බුෂ් සිය පරිපාලනයේ ඉරාක "නව මූලෝපාය" ප්‍රකාශයට පත් කිරීම පෙන්නුම් කරන්නේ සියල්ලන්ටත් වඩා ඇමරිකානු ධනේශ්වර ප්‍රජාතනත්‍රවාදයේ පරිපූර්න හිස් බවත් දිරාපත් වීමත් ය. ඉරාක යුද්ධය එහැම පිටින්ම ප්‍රතික්ෂේප කිරීම හමුවේ බුෂ් තන්ත්‍රය ඉරාකයේ මිලිටරි මෙහෙයුම් උත්සන්න කිරීමට පියවර ගෙන ඇතුවා පමනක් නොව ඉරානයට හා සිරියාවට එරෙහිව එල්ල කරන විවෘත තර්ජනය මුලු මැද පෙරදිගම වෙලා ගත් යුද්ධයකට අත වැනීමකි. පෙබරවාරි 11 දින බුෂ්ගේ රාජ්‍ය තත්ව වාර්තාව තුල මෙම තර්ජනය යලි යලිත් එල්ල කර තිබේ.

නව මූලෝපායේ අන්තර්ගතය අප, ඉදිරියේ දී පරීක්ෂා කර බලන්නෙමු. එහෙත් සියල්ලටම ප්‍රථම, යුද්ධය උත්සන්න කිරීම හා පැතිරවීම, එක්සත් ජනපදය තුල ම ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතිරිව ඇති සියල්ල අතුගා දැමීම සමග එකට ගමන් කරන්නේ යයි අප නිරන්තරයෙන් සඳහන් කරන මූලිකව වැදගත්වන කාරනය අවධාරනය කල යුතු ය.

"නව මූලෝපාය" ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සිය මාධ්‍ය හමුවීම්වල දී, බුෂ් හා චේනි යන දෙදෙනාම අවධාරනය කලේ කොන්ග්‍රස් මැතිවරන ප්‍රතිඵලය හෝ ඡන්ද සංඛ්‍යා ඔවුන්ගේ යුද වැඩ පිලිවෙලට හරස් නොවන බවයි. ජනවාරි 14 දින සීබීඑස් සාකච්ඡාකරු වෙත බුෂ් මෙසේ ප්‍රකාශ කලේ ය. "මා එසේ කිරීමෙන් වලක්වා ලීමට ඔවුන් (කොන්ග්‍රසය) උත්සාහ කරනු ඇතැයි මම හොඳින්ම දනිමි. එහෙත් මම තීරනය ගෙන අවසන් ය. අප ඉදිරියට යන්නෙමු."

චේනි ඊටත් වඩා නිසැක විය. "ජනාධිපති හමුදා ආඥාපති ය. එවන් දැඩි තීරන ගන්නේ ඔහු ය. බලය පාවිච්චි කරන්නේ කෙසේ ද, බලය යොදන්නේ කොතැනට ද යන්න තීරනය කල යුතු පුද්ගලයා ඔහු ය. කොන්ග්‍රසය සිය මඩිස්සලයේ බලයෙන් මෙම උත්සාහයට පැහැදිලිවම සහයෝගය දිය යුතු ය. එලෙස ඔවුන්ට කාර්යභාරයක් ඇති බව අප පැහැදිලිවම වටහා ගෙන සිටින්නෙමු. එහෙත් යුද්ධයක් කොමිටියක් හරහා ගෙනයා නොහැකි ය."

මෙහිදී විස්තාරනය කෙරෙන්නේ විධායක ආඥාදායකත්වයේ ඉදිරිදර්ශනයකි. කොන්ග්‍රසය ඉවත දමා ජනාධිපති ඉදිරියට එයි. ජනාධිපති ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ජනතාවට වගකීමට බැඳී නැත. ඒ වෙනුවට හමුදා ආඥාපති ලෙස ජනාධිපතිගේ කර්තව්‍ය වනුයේ විධායකය විසින් තීරනය කරන මිලිටරි අරමුනු කරා යාම සඳහා ජනතා අභිමතය අභිබවා යෑම ය.

චේනි ෆොක්ස් සාකච්ඡාකරුට පැවසූ පරිදි ව්‍යවස්ථාදායකය හරහා ප්‍රකාශයට පත් කෙරෙන ජනතාවගේ කැමැත්තට විධායකය කෙසේ හෝ වගකිව යුතු ය යන සංකල්පය පෙරලා දැමිය යුතු ය.

"එය, එක්සත් ජනපදයට අහිත කර වේ යයි අපගේ ප්‍රතිවාදීන් විශ්වාස කරන ප්‍රාථමික මූලෝපායේ අවියෝජනීය කොටසකි. මැතිවරන ව්‍යාපාරයේ අවසාන ප්‍රතිඵලය ද කොන්ග්‍රසය තුල දැනට කෙරීගෙන යන විවාදය ද යන සියල්ලෙන් ඔවුන් ඒත්තුගෙන සිටින්නේ ත්‍රස්තවාදයට එරෙහිව කරගෙන යන දිගු යුද්ධය එක්සත් ජනපදයට දැරිය නොහැකි යයි කියන විට ඔවුන් නිවැරදි බවයි."

"ඔවුන් එසේ විශ්වාස කරති. 83 දී ලෙබනනයේ ද 93 දී සෝමාලියාවේ ද ඊට පෙර වියට්නාමයේ ද අතීත අත්දැකීම් ඔවුන් සිහිපත් කරති. සතුරා අපගේ සෑහෙන ගනනක් මරා දැමූ විට එක්සත් ජනපදය කල යුත්තේ පොදිබැඳගෙන ගෙදර යාම යයි ඔවුන් විශ්වාස කරති. මුහුනට මුහුනලා සටනකින් ඔවුන්ට අපව පරාජය කල නොහැකි නමුත් ඔවුන් සිතන්නේ අපගේ අධිෂ්ඨානය බිඳ දැමිය හැකි බවයි. අපට සිටින්නේ මැතිවරන ප්‍රතිඵලය දෙස බලා ඒවා නොපිට හැරී ඇති බව දැක "මලකෙලියයි, අප දැන් නිහඬවිය යුතුයි, සිදුවිය හැකි එකම දේ අල් කයිඩාවේ ලෝකය පිලිබඳ දෘෂ්ටිය සනාථ වීමයි." යන නිගමනයට එලැඹෙන ජනාධිපතිවරයෙක් නම්, නිසැකවම එය නොකල යුතු දෙයයි. මෙම ජනාධිපති ජනමත විමසුම් පදනම් කරගෙන ප්‍රතිපත්ති සකස් නොකරයි. ඔහු එසේ නොකල යුතු ය. මෙහි දී පරමවසයෙන් ම අවශ්‍ය කෙරෙන්නේ අප එය නිවැරදිව වටහා ගැනීමයි."

සැබැවින්ම යුද්ධය ප්‍රතික්ෂේප කිරීම හුදෙක් ජනමත විමසුමක ප්‍රකාශනය නොව මැතිවරනයේ ප්‍රකාශනයයි. තවද ඇමරිකානු පාලනාධිකාරය තුල ම ගැඹුරුවන උත්සුකයන් පවතියි. කුමන මිම්මකට අනුව වුවත් ආර්ථිකව, දේශපාලනිකව හා මිලිටරිමය වසයෙන් පවා එක්සත් ජනපදයේ ගෝලීය තත්වය පිරිහීමට පත්ව තිබේ. බේකර් හා හැමිල්ටන් විසින් සකස් කල අයිඑස්ජී (ඉරාක අධ්‍යයන කන්ඩායම) වාර්තාවෙන් ද ප්‍රකාශයට පත් වූ පරිදි පාලක කවයන් තුල පවතින සැලකියයුතු සැකසංකාවන්ට මෙය හේතු වී තිබේ. එහෙත් බුෂ්, වාර්තාව ප්‍රතික්ෂේප කලේ ය.

ඇමරිකානු රාජ්‍ය පද්ධතියේ ව්‍යුහය තුල ම ආවේනික අර්බුදයක් පවතින්නේ යයි යමෙකුට හැඟෙනු ඇත. ඉරානය හෝ සිරියාව ආක්‍රමනය කිරීමේ තත්වයක් තුල කුමක් සිදු වනු ඇත් ද? කොන්ග්‍රසය තුල විරුද්ධත්වය පලවේ ද? නැතහොත් පරිපාලනය ගන්නා ක්‍රියාමාර්ගයේ නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක් කරයි ද? සතුරාට ආධාර කිරීමේ පදනම මත විධායකය සරලවම කොන්ග්‍රසය වසා දමයි ද? චේනිගේ තර්කනයේ ඇඟවුම එයයි.

එවන් පියවර ගනු ලැබුවහොත් ඩිමොක්‍රැටිකයන්, 2000 වසරේදී මැතිවරන ජයග්‍රහනය බුෂ්ට හිමි කර දුන් ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුවට සහාය පල කල ආකාරයට ඔවුන් සතු සියලු බලය ජනතා විරෝධය වැඩී ඒම වැලැක්වීමට යොදනු ඇත. එහෙත් එදා සිට අද දක්වා මිලියන ගනන් සාමාන්‍ය ජනතාව බොහෝ අත්දැකීම් ලබා ඇති අතර ඔවුන්ගේ ප්‍රතිචාරය බෙහෙවින් වෙනස්වනු ඇත.

විධායක ආඥාදායකත්වය පිලිබඳ යෝජනා බොහෝ දුර එනම් අධිකරනය තුලට ද විනිවිද තිබේ. බුෂ්ගේ " තල්ලුව" නම් සැලැස්ම පිලිසිඳගත්, ඇමරිකානු ව්‍යවසාය ආයතනය හමුවේ කථාකල නීතිපති ඇල්බර්ටෝ ගොන්සාලේස් කියා සිටියේ, විනිශ්චයකරුවන් ජාතික ආරක්ෂාව පිලිබඳ තීන්දු නොදිය යුතු බවයි. " විනිශ්චයකරුවන් කිසිවිටෙකත් රටේ ජාතික ආරක්ෂාව පිලිබඳ අවශ්‍යතාවන් අවබෝධ කරගත හැකි තත්වයක නොසිටියි." ජාතික ආරක්ෂාව පිලිබඳ ප්‍රශ්නයක දී අධිකරනය විධායක අංශය පිලිබඳව "වෙනස්ලෙස පෙනීසිටිය" යුතුය. "විනිශ්චයකරුවන්ට සමස්ත විධායක අංශය ම සතු සාමූහික ඥානය පිලිබඳ තොරතුරු රැස් කර ගත හැක්කේ කෙසේ ද? අපගේ රටෙහි ජාතික ආරක්ෂක අවශ්‍යතා කවරක්දැයි තීරනය කල හැක්කේ කෙසේ ද? ඔවුන්ට එවැන්නක් කිරීමේ හැකියාව ඇත්තේ නැත."

"මම විනිශ්චයකරුවෙක් වේ යයි සිතාගැනීමට උත්සාහ කරමි. එවිට ඇෆ්ගනිස්ථානය හෝ ගුවන්තනාමෝ හි සිදුවන දේ ගැන මම දන්නේ කුමක් ද?"

ගොන්සාලේස්ගේ තර්කය වන්නේ ජනාධිපති " හමුදා ආඥාපති" වන බැවින් ඔහුගේ යුද පිලිවෙතට අභියෝග නොකල යුතු බවයි. "ජාතික ආරක්ෂාවට"

අදාලව විධායකය විසින් ඇමරිකානු පුරවැසියන්ට එරෙහිව ගන්නා කුමන පියවරකදී හෝ එය, අධිකරන විෂය පථය යටතට නොගත යුතුය.

## විරුද්ධ පක්ෂයේ ඩිමොක්‍රටිකයන්ගේ දෘෂ්ටිය

යුද්ධය කෙරෙහි ඉහවහා ගිය මහජන විරෝධය නිදැල්ලේම උල්ලංඝනය කල හැකි යයි බුෂ් හා චේනි සිතන්නේ නම් ඒ, බොහෝ කලකට පෙර ම ඩිමොක්‍රටික "විරුද්ධත්වය" ඔවුන් මැන ගෙන තිබීම නිසා ය. තමන්ට අභියෝග කල හැකි පියවර කොන්ග්‍රසය තුල ක්‍රියාවට නැගීමේ කිසිදු අභිප්‍රායක් ඩිමොක්‍රටිකයන්ට නොමැති බව, ඔවුහු වටහා ගෙන සිටිති. ජනවාරි 12 දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයේ ජැකොබ් වේස්බර්ග් විසින් පලකල රුදුරු තීරු ලිපියක් තුල ඩිමොක්‍රටිකයන්ගේ දෘෂ්ටිය කැටිකොට දක්වයි.

"තේරීමක් නොමැතිව කොන්ග්‍රසය අසරන වෙයි" යන ශීර්ෂය යටතේ ඔහු මෙසේ ලිවී යඃ "දශක ගනනාවකට පෙර මනෝවිද්‍යාඥ මාර්ටින් සෙලිග්මන් 'වටහා ගත් අසරන භාවය' යන සිය න්‍යාය වර්ධනය කලේ ය. එක දිගට දඬුවමට ලක් වීම නිසා තිරිසනුන් මෙන් මිනිසා ද, සැබැවින්ම තමන් එය කලා හෝ නොකලා වුවත් තමන්ට සිදුවන දේ වැලැක්විය නොහැකි යයි විශ්වාස කිරීමට පටන් ගනිති. සෙලිග්මන්ගේ ප්‍රාථමික පරීක්ෂනයට අනුව, යලි යලිත් විදුලි සැර යෙදීමට ලක් වූ බල්ලන් එම නොපනත්කම මග හැර පලා යෑමට ශක්තිය තිබුනත්, බිම දිගාවී කෙඳිරිගාති.

"සුනඛයන්ට මෙන්ම එය ඩිමොක්‍රටිකයන්ට ද පොදු ය. න්‍යායිකව, දැන් ඔවුන් ආන්ඩුවේ සමාන අංශයක් පාලනය කරති. එහෙත් ප්‍රායෝගිකව, වසර ගනනාවක් තිස්සේ කුරිරු විධායකයේ තැලීමට ලක් වීමෙන් කෙතරම් කම්පාවට පත්ව සිටීද යත් ස්වාමියා ඔවුන් වෙත කෙවිට වනන සෑමවිටම බියාදු ලෙස වකුටු වී ගනිති.

"මෙම සංසිද්ධිය වඩාත් නින්දාසහගතවන්නේ, ජාතික ආරක්ෂාව, ඉරාක යුද්ධය හා ත්‍රස්තවාදය පිලිබඳ කොන්ග්‍රසයේ බලය සම්බන්ධිතව ය. ජනවාරි 7 දින ඩිමොක්‍රටිකයන්ගේ විදේශ පිලිවෙතේ ප්‍රමුඛයා වන සෙනෙට් සභික ජෝශප් බිඩන් *මාධ්‍ය* හමුවන්න වැඩසටහනට සහභාගි වූ අවස්ථාවේ, ජනාධිපති ජෝර්ජ් බුෂ් ඉරාකයට අතිරේක ඇමරිකානු හමුදා යැවීම පිලිබඳ සිය සැලැස්ම ඉදිරිපත් කල විට ඔහු කුමක් කිරීමට අදහස් කරන්නේ දැයි විමසන ලදී. පිලිතුර මෙසේ ය. 'ඒ ගැන මට කලහැකි වැඩි යමක් නැත. කිසිවෙකුටත් ඒ ගැන වැඩි යමක් කල නොහැකි ය. ඔහු හමුදා ආඥාපති ය.'"

මෙහි පැහැදිලි කෙරෙන ඩිමොක්‍රටිකයන්ගේ මානසිකත්වය පිලිබිඹු කරන්නේ ඇමරිකානු ලිබරල්වාදයේ පරිපූර්න බිඳ වැටීම යි. - දශක ගනනාවක් සිදු වූ ක්‍රියාවලියකි - මානසිකත්වයටත් වඩා වැදගත් වන්නේ, අවශ්‍ය කුමන මාධ්‍යයකින් හෝ එක්සත් ජනපදයේ ගෝලීය ආධිපත්‍ය සංරක්ෂනය කිරීම වඩාත් තීරනාත්මක ප්‍රශ්නය වන්නේ ය යන ඇමරිකානු දේශපාලන සංස්ථාපිතයේ සියලු කොටස් අතර ඇති එකඟතාවයෙන් ගලා එන ඩිමොක්‍රටිකයන්ගේ දෘෂ්ටිය යි. බුෂ් පාලනාධිකාරය සමග ඇති ඔවුන්ගේ මතභේද මෙම අරමුන පිලිබඳව නොව එය ගෙනයන ක්‍රමවේදයන් පිලිබඳව යි.

බුෂ් සමග ඩිමොක්‍රටිකයන්ට මතභේද නොමැති බවක් මින් අදහස් නොකරයි. බොහෝ රිපබ්ලිකානුවන්ට මෙන් ම ඔවුන්ට ද මතභේද පවතී. එහෙත්, ඇමරිකාවේ ගෝලීය ආධිපත්‍යය පවත්වා ගැනීම පිලිබඳව ඔවුන් බෙදාහදාගන්නා අරමුන කරා ලඟාවිය හැකි තර්කාන්විත විකල්පයක් ඔවුන්ට නැත. බුෂ් පාලනාධිකාරය මෙය වටහා ගෙන සිටියි. සිය විවේචකයන්ට එරෙහි ඔවුන්ගේ නිරන්තර ප්‍රතිප්‍රහාරය "නුඹට ඇත්තේ කුමන විකල්පයක් ද?" යන්න ය. අප්‍රකාශිත තර්කය නම් එක්සත් ජනපදයේ ගෝලීය තත්වය පවත්වාගැනීමේ අවශ්‍යතාවය පිලිබඳ දෙපාර්ශ්වයේ ම එකඟත්වයයි.

"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" බුෂ් විසින් හැඳින්වූයේ අපගේ කාලයේ ශ්‍රේෂ්ඨතම දෘෂ්ටිමය අරගලය ලෙස ය. එක්සත් ජනපදයේ ම මැත අනාගතය ඊට බැඳී ඇති බව ඔහු කියයි. සැබැවින්ම මෙහි දී පරදුවට තැබී ඇත්තේ කුමක් ද? අල් කයිඩා ත්‍රස්ත කන්ඩායමකට හෝ ඉස්ලාමීය අන්තවාදීන් කන්ඩායමකට එක්සත් ජනපදය විනාශ කල හැකි යයි කිසිවෙකුත් බැරෑරුම්ව විශ්වාස නොකරයි. යථාර්ථයේ දී සුවිශාල බලවේගයන් ක්‍රියාත්මක වේ.

ඩිමොක්‍රටික් පක්ෂයේ ඊනියා ලිබරලුන්ගෙන් කොනක් වන ජෙෆ්රි හර්ෆ් විසින් මෑතක දී පලකල ලිපියක ඉන් සමහරෙක් ගැන ඇඟවුම් කර තිබේ. හර්ෆ් ලිබරල් මූලධර්මවල පදනමෙන් ඉරාක ආක්‍රමනයට යුක්ති කරනයක් සම්පාදනය කිරීමට උත්සාහ කරන බ්‍රිතාන්‍යයේ මුල්බැසගත් ප්‍රවනතාවක "යූස්ටන් ප්‍රකාශනය" නම් කන්ඩායමේ ඇමරිකානු ආධාරකරුවෙකි.

*නව ලිබරල්වාදය, රැඩිකල් ඉස්ලාමීයවාදය හා ඉරාක යුද්ධය* යන හිසින් යුත් හර්ෆ් ගේ ලිපියට අනුව "පර්සියන් බොක්කේ ද මැද පෙරදිග ද දේශපාලන අනාගතය, එක්සත් ජනපදයට හා අපගේ යුරෝපීය සගයන්ට මෙන් ම ඉන්දියාවට, චීනයට හා නූතන අරාබි රටවලට ද වැදගත් ජාතික අවශ්‍යතාවක් බවට පත් වී තිබේ. එසේ වන්නේ ලෝක ආර්ථිකය තෙල් මත දුවන බැවින් ය. එම නිසා මෙම කලාපයේ ස්ථාවරත්වය පෘතුවිගෝලය වටා සෑම රටකට ම වැදගත්

අවශ්‍යතාවකි. මෙම කලාපයේ ආධිපත්‍යය රැඩිකල් ඉස්ලාම්වාදීන් වේවා අනාගමික රැඩිකල්වාදීන් වේවා අතීතයේ දී සදාම්ගේ ඉරාකය හෝ අද ඉරානය හෝ අතට පත් නොවීම එක්සත් ජනපදයට මෙන් ම තෙල් මත යැපෙන සියලු ජාතීන්ට එකසේ වැදගත් අවශ්‍යතාවකි. එවන් ආධිපත්‍යයක් වැලැක්වීම එක්සත් ජනපදයට අවශ්‍ය වන්නේ මඳවසයෙන් නොවේ.

"දෙවැනි ලෝක යුද්ධය හා සීතල යුද්ධය යන දෙකෙහි දී ම එක්සත් ජනපදය අවධාරනය කලේ සමස්ත යුරෝපයේ ද ආසියාවේ ද ආධිපත්‍යය එක් බලයක අධිකාරයට පත්වීම වලක්වා ගැනීම වැදගත් අවශ්‍යතාවක් වන බවයි.

"දැන් මෙරට දේශපාලනිකව අධිකාරවත් පරම්පරාව හැඩ ගැන්වූ අත්දැකීම වියට්නාම් යුද්ධයයි. ඉරාක යුද්ධයට පටහැනි ලෙස එම යුද්ධය ගෙන ගිය රට ඇමරිකානු අවශ්‍යතාවන්ට මඳ වසයෙන් වැදගත් වූවා මිස අවශ්‍යයෙන්ම වැදගත් නොවී ය. ජනසංහාරක අවි සඳහා විභවයක් ඇති තෙල් හා රැඩිකල් ඉස්ලාම් දහමේ දෘෂ්ටිමය අරමුනු එකට බද්ධ වීමේ අර්ථය, වියට්නාමයේදීට වඩා ඉරාකයේ දී පරදුවට තැබී ඇති දේ අති විශාල බවය" යි හර්ෆ් කියා සිටියි.

ඩිමොක්‍රටික් පක්ෂ නායකත්වයේ සිතුම්පැතුම් පිලිබඳ තවත් ඇස් අරවන අවස්ථාවක් ජනවාරි 8 දින මූලෝපායික හා ජාත්‍යන්තර අධ්‍යයන කේන්ද්‍රය මගින් සංවිධානය කල "ඉරාකයේ ඉදිරිමග" නම් සාකච්ඡාව තුලින් උදාවිය. මෙය ලෝක සමාජවාදී වෙබ් අඩවියේ බැරී ග්‍රේ බැහැර කර පැවැත්වූ සාකච්ඡාවකි. මෙය සලකුනු කලේ බුෂ් කෙරෙහි වූ විරෝධය ඉරාක යුද්ධය පදනම් කර ගෙන වූවක් නොව - ඩිමොක්‍රටිකයන් යුද්ධයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කර තිබුනි - යුද්ධය නරක අතට හැරීම නිසා එක්සත් ජනපදයේ දිගුකාලීන මූලෝපායිකත්වය අනතුරේ හෙලීමේ කාරනය මත ඇතිවූවක් බවය.

සාකච්ඡාවට කොන්ග්‍රසයේ හමුදා සේවා කමිටුවේ ප්‍රමුඛ සාමාජිකයින් සිව් දෙනෙක් කරුනු ඉදිරිපත් කලහ. වඩාත් ඇස් අරවන කරුනු දැක්වූයේ ජෝර්ජියාවේ ඩිමොක්‍රටික ජිම් මාර්ෂල් ය. "අප රටක් ලෙස, ආන්ඩුවක් ලෙස හා කොන්ග්‍රසයක් ලෙස සුලු විස්තර කෙරෙහි අවධානය යොමු කල හැකි නමුත් ඒ සමග ම දැවැන්ත කරුනු ගිලිහී යාමට පටන් ගනියි. එහෙත් ඔබ වාඩිවී අප හමුවේ ඇති ගෝලීය තර්ජනයන් කෙරෙහි අවධානය යොමු කරන්නේ නම්, එවිට ඒවා ඉරාකය හා ඇෆ්ගනිස්ථානයට වඩා දුරට විහිදී යන බවත් අප යථාර්ථයෙන් ඉවත් වී ඇති බවත් පෙනීයනු ඇත. මින් අදහස් කරන්නේ ඉරාකය හා ඇෆ්ගනිස්ථානය සුලු කොට තැකීමක් නොවේ. එය එසේ නොවේ. එහෙත් අප විසින් ග්‍රහනය කරගත යුතු ලෝකය හමුවේ ඇති ගෝලීය ප්‍රශ්න එක්සත් ජනපදයේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වීමේ වැඩි ඉඩක් පවතී.

"එක්සත් ජනපදයේ ජනගහනයෙන් සියයට පහක් ලෝක ධනයෙන් සියයට 25-40 අතර ප්‍රමානයක් පාලනය කිරීමේ කාරනය ගැන නිකමට සිතා බලන්න. එමෙන්ම ලෝකයේ බිලියන 5ක් ජනතාවට දිනකට ලැබෙන්නේ ඩොලර් 2ක් නම්, දේශගුනික විපර්යාස, මනා සම්බන්ධීකරනයකින් හෝ පාලනය කිරීමේ අධිකාරී බලයක් කිසිසේත් ම නොමැති ආර්ථික සහානුබද්ධයන්, ලෝක වසංගත, නැගෙන මිලිටරි තර්ජන, ගෝලීය ත්‍රස්තවාදී ජාලයන් වැනි දේ ට කාර්යක්ෂමව මුහුන දිය හැකි සැබෑ ප්‍රාදේශීය හෝ ජාත්‍යන්තර හවුල්කරුවන් නොමැති තත්වයක් ගැන ද සිතා බලන්න. එන්ට එන්ටම ඒකාග්‍ර වන පෘතුවි ගෝලයක අප ක්‍රියා කරන්නේ එහි කොතැනක හෝ හුදෙකලාව සිටින සුලු පිරිසකට පෘතුවි ගෝලය මත එන්ට එන්ටම වැඩිවන හා වැදගත්වන බලපෑමක් කල හැකි තත්වයක නම් ශිෂ්ටාචාරයක්, ගෝලීය ශිෂ්ටාචාරයක් ලෙස අප හමුවේ ඇති අභියෝගයන්ට මුහුන දීම සඳහා සංවිධානය වන්නේ කෙසේ දැයි අප සිතා බැලිය යුතු ය. මේවා දැවැන්ත ප්‍රශ්න ය. ඒවාට මෑත අනාගතයේදී ම මුහුන දීමට සිදුවනු ඇත."

## ඉරානයට එරෙහි යුද සූදානම

වෙනත් කිසිවෙක් ශක්‍ය විකල්ප මූලෝපායක් ඉදිරිපත් නොකල තතු තුල, බුෂ් පාලනාධිකාරය උත්සුක වන එකම ඉදිරි මාවත වැටී ඇත්තේ මැදපෙරදිග තුල යුද්ධය ව්‍යාප්ත කිරීම හරහා ය. සිය ආස්ථානය ගෙනහැර දැක්වූ ජනවාරි 10 දින ඔහුගේ රාජ්‍ය තත්ව වාර්තාව කරුනු දෙකක් සම්බන්ධයෙන් වැදගත් වේ.

ප්‍රථම කොට, ඉරාකය විශේෂයෙන් ම බැග්ඩෑඩය සම්බන්ධ පිලිවෙතෙහි වෙනස හා දෙවැනුව ඉරානයට හා සිරියාවට එල්ල කරන තර්ජන ය. සැබැවින්ම, කථාවේ මධ්‍යම යොමුව පැවතියේ ඉරාකයට නොව ඉරානයට එරෙහිව බව කිව හැකි ය.

පසු ගිය සති හා මාසවල, ඉරානයට එරෙහි එක්සත් ජනපද යුද සූදානම පෙන්නුම් කරන පියවර මාලාවක් ගෙන තිබේ.

- දෙවෙනි යුද නැව පර්සියන් බොක්කෙහි හා මිසයිල නාශක පේට්‍රියට් මිසයිල ඉරාකයෙහි ස්ථානගත කිරීම, මෙම පියවරයන් එකක්වත් ඉරාකයේ අභ්‍යන්තර තත්වයට සම්බන්ධ නොමැති අතර පියවර දෙකම වැදගත් වන්නේ ඉරානයට එරෙහි මිලිටරි මෙහෙයුම්වල දෘෂ්ටි ආස්ථානයෙනි. එසේම මැදපෙරදිග භාරව නාවික ගුවන් හමුදා ප්‍රධානී විලියම් ෆැලොන් මධ්‍යම ආඥාපති ලෙස පත් කර තිබේ.
- පසු ගිය දෙසැම්බරයේ දී ඉරාන තානාපති නිලධාරීන් ගනනාවක් ද පසුව 1992 සිට ක්‍රියාත්මක වන ඉරාන තානාපති කාර්යාලයේ 6 දෙනෙක් ද අත්අඩංගුවට ගැනීම.

- බුෂ් සිය කතාව තුල එක්සත් ජනපද හමුදාවන් "ඉරානය හා සිරියාවෙන් ගලා එන ආධාර නතර කරන" බවත් "ඉරාකයේ අප සතුරන්ට පුහුනුවීම් හා නවීන අවි ආයුධ සැපයුම් ජාලයන් විනාශ කරන" බවත් පැවසී ය. කොන්ග්‍රස් සභා කරුනු දැක්වීම් තුලදීත් පලල් ලෙසත් මෙම පියවරයන් කැපීපෙනෙන ලෙස වියට්නාම් යුද්ධයේදී කාම්බෝජය තුල එක්සත් ජනපදය ගෙනගිය නීති විරෝධී මිලිටරි මෙහෙයුම්වලට සමාන වන බව සඳහන් වී තිබේ.
- කතාවෙන් පසුව බුෂ් පාලනාධිකාරයේ සාමාජිකයන් ඉරානයට එල්ල කල ප්‍රකාශ මාලාවක්ම කර තිබීම, ජාතික ආරක්ෂක උපදේශක ස්ටෙෆන් හැඩ්ලිගේ ප්‍රකාශය සංකේතවත් ය. "මාධ්‍ය හමුවන්න" වැඩ සටහනට ඔහු ප්‍රකාශ කලේ ඉරාක යුද්ධය, " කෘෘර ත්‍රස්තවාදී බලවේග හා ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස සඳහා බලවේග අතර මැදපෙරදිග තුල කෙරීගෙන යන පුලුල් අරගලයක් බවයි. මේ බොහොමයක් පිටුපස ඉරානය සිටියි."

ඉරාකයේ තත්වය ගැන උත්සුක වන තාක් දුරට, ප්‍රධාන වෙනස්කම වන්නේ මලිකි ආන්ඩුවේ අනුමැතිය ඇතුව හෝ නැතුව, එක්සත් ජනපද හමුදා දැන් සදර් නගරයේ මෙහ්දි හමුදාවට එරෙහිව මෙහෙයවෙමින් සිටීමයි. යුද්ධය ආරම්භයේ පටන් එක්සත් ජනපදයේ ඉරාක ප්‍රතිපත්තියෙහි ප්‍රතිවිරෝධයක් හැමවිටම පැවතුනි. එක් අතකින්, 1979 දී ෂා පෙරලාදැමීම මගින් එල්ල වූ ප්‍රහාරයෙන් කිසිවිටෙක ගොඩ නොආ වොෂින්ටනය, ඉරානයේ පාලන තන්ත්‍ර වෙනසක් සඳහා වූ එහි අරමුන කරා ගමන් ගන්නා අතර ම, ඉරානයෙන් දේශපාලන හා ද්‍රව්‍යමය ආධාර ලබාගන්නා බැග්ඩෑඩයේ ආන්ඩුවත් සමග වැතිර සිටියි. මෙම ප්‍රතිවිරෝධය විසඳන්නේ කෙසේ ද? ජේම්ස් බේකර්ගේ ඉරාක අධ්‍යයන කන්ඩායම (අයිඑස්ජී) එක් විකල්පයක් එනම් සිරියාව හා ඉරානය සමග එකඟතාවකට පැමිනීම සඳහා සාකච්ඡා ආරම්භ කරන ලෙස යෝජනා කලේ ය. එහෙත් බුෂ් පරිපාලනය මෙය ප්‍රතික්ෂේප කලේ, එහි අර්ථය මැද පෙරදිග ඇමරිකානු ප්‍රතිපත්තිය මුලුමනින්ම නව නැම්මක් ගැනීම මෙන් ම එක්සත් ජනපදය හා ඊස්රායලය අතර සබඳතාවයේ වෙනසක් තුල විය හැකිව තිබුනු නිසා ය. ඉතිරි එකම විකල්පය ඉරානයේ "පාලන තන්ත්‍ර වෙනසක්" සඳහා වූ ක්‍රියාමාර්ගය සමග ආක්‍රමනශීලී ලෙස ඉදිරියට යෑමයි. එහෙත් ඒ සඳහා, ඉරානයට පහර දුනහොත් ඇමරිකානු හමුදාවලට එරෙහිව ප්‍රහාරයක් දියත් කිරීමේ ඉඩකඩ පැවතීම නිසා බැග්ඩෑඩයේ ෂියා හමුදාවන් තලා දැමීම අවශ්‍ය කෙරේ. පසු ගිය වසරේ ඊස්රායලය ලෙබනනයට එරෙහිව ගෙන ගිය යුද්ධයේ දීත් වැඩ කලේ මෙම තර්කනයම යි. එම ප්‍රහාරයේ එක් අරමුනක් වූයේ, ඊස්රායලය හෝ එක්සත් ජනපදයම විසින් ඉරානයට එරෙහිව ප්‍රහාරයක් දියත් කරන විට, හෙස්බුල්ලා සංවිධානය විනාශ කිරීම මගින් එම පාර්ශ්වයෙන් ඊස්රායලයට එරෙහිව එල්ල වන තර්ජනය මගහැරීම යි.

## එක්සත් ජනපදයේ අර්බුදය හා ලෝක ධනවාදය

එන්ට එන්ට ම එක්සත් ජනපදයේ ප්‍රතිපත්තිය උමතු ස්වභාවයකට පත් වෙමින් තිබෙන්නේ, සෑම මිලිටරි ආක්‍රමනයක් ම නව ගැටලු හා නව තවත් සතුරන් නිර්මානය කරමින් ඒවායින් අත්මිදීම සඳහා වඩවඩාත් මිලිටරි බලය යෙදවීමට බලකිරීමෙනි. කෙසේ වුව ද මෙම උමතුව හුදෙක් ම බුෂ් පාලනාධිකාරයේ සාමාජිකයන්ගේ නිමැවුමක් නොවේ. එය ගලා එන්නේ සමස්තයක් ලෙස ලෝක ධනවාදය විශේෂයෙන්ම එක්සත් ජනපදය මුහුන දෙන අර්බුදය තුලිනි.

මෙම කාරනයට නිදසුන් වසයෙන්, ලිබරල් ජාත්‍යන්තර සබඳතාවන්ගේ න්‍යායාචාර්යවරයෙකු වන ජෝන් අයිකෙන්බරි විසින් 2002 සැප්-ඔක්. ෆොරින් එෆෙයාර්ස් සඟරාවෙහි පලකල ලිපියකට යොමු වීමට ඉඩ දෙන්න. ඉරාක ආක්‍රමනය සූදානම් කෙරෙද්දී, සීතල යුද්ධය අවසානයේ දී, සිදු නොවූ පරිද්දෙන්, ලෝකය පරිවර්තනය කිරීමට තර්ජනය කරන ඇමරිකානු අධිරාජ්‍ය අභිලාෂයන්ගේ වැඩීයාම නියෝජනය කරන බුෂ් පරිපාලනයේ නව ධර්මතාවය, අයිකෙන්බරි විසින් කනස්සල්ලෙන් නිරීක්ෂනය කලේ ය.

"සැකසීගෙන එන ඇමරිකාවේ නව අධිරාජ්‍ය මහා මූලෝපාය, ලෝක ප්‍රජාවේ හා දේශපාලන හවුල්කාරිත්වයේ වස්ත්‍රය ඉරා දැමීමට තර්ජනය කරන්නේ, හරියටම එම ප්‍රජාවටත් එම හවුල්කාරිත්වයටත් එය, වහාම අවශ්‍යව ඇති මොහොතේ ය. මෙය, උපද්‍රවයන්ගෙන් පිරී ගිය හා අසාර්ථක වියහැකි ප්‍රවිශ්ටයකි. එය දේශපාලනිකව නොදැරිය හැකිවා පමනක් නොව රාජ්‍යතාන්ත්‍රිකව ව්‍යසනකාරී ය. ඉතිහාසයෙන් මග පෙන්වීමක් තිබේ නම් එය, ප්‍රතිගතිතාවන් හා ප්‍රතිරෝධයන් අවුලුවාලනු ඇති අතර එමගින් ඇමරිකාව වඩා සතුරු හා බෙදී ගිය ලෝකයක හුදෙකලා වනු ඇත."

යථාර්ථවත් විදේශ පිලිවෙතක් මත පදනම්ව, එක්සත් ජනපදයේ උක්ත වීර්යයෙන් නිර්මානය කල පශ්චාත් දෙවැනි ලෝක සංග්‍රාම අවධිය, අයිකෙන්බරි විසින් හුවා දක්වයි. ඒ යටතේ අනෙකුත් රාජ්‍යයන් පිලිගැනීමක් මෙන් ම යම් දුරකට අඩංගුකර ගැනීමක් ද සිදුවූ අතර නිදහස් වෙලඳපොල ආර්ථික පිලිවෙත ස්ථාපිතකල "ලෝක ඉතිහාසයේ වඩාත්ම ස්ථාවර හා සෞභාග්‍යමත් ජාත්‍යන්තර පද්ධතියක්" නිර්මානය කලේ ය.

මෙය දැන්, නොඳුරිය හැකි හා අවසාන වසයෙන් ඇමරිකානු අවශ්‍යතාවන්ටම හානිකර යයි ඔප්පු වී ඇති නව අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියක් මගින් තර්ජනයට ලක්ව තිබේ.

සිය ලිපිය නිමා කරමින් අයිකෙන්බරි අවධාරනය කරන්නේ "ඇමරිකාවේ ආරක්ෂක හවුල්කාරිත්වයන් හුදෙක් උපකාරක උපකරන නොව, ඇමරිකාව නායකත්වය දෙන සංරක්ෂනය කලයුතු ලෝක දේශපාලන පර්යායක තීරනාත්මක උපාංගයන්ය යන දෘෂ්ටිය මත පදනම්වූ එහි පැරනි මූලෝපායන් එක්සත් ජනපදය විසින් ප්‍රකෘතිමත් කල යුතු" බවය.

බුෂ්ගේ අධිරාජ්‍ය පිලිවෙතෙහි ව්‍යසනකාරී ප්‍රතිවිපාකයන් පෙන්වාදීමට අයිකෙන්බරි වැනි ලිබරල්වාදීන්ට හැකි වී තිබේ. එහෙත් කිසිවෙකුටත් පිලිතුරු දීගත නොහැකි වී ඇති ප්‍රශ්නය නම් එම පිලිවෙත තවමත් අනුගමනය කරන්නේ කුමක් නිසා ද යන්නට ය. සිව් වසරකට පසුවත් ඒ හුදෙක් බුෂ්ගේ විදේශ පිලිවෙත් සැලසුම්කරුවන්ගේ වික්ෂිප්තභාවය නිසා බවට කෙරෙන ප්‍රකාශ තහවුරු නොකල හැකි ය. බුෂ්ගේ පිලිවෙතෙහි ගැඹුරු සමාජ මූලයන් තිබිය යුතු ය.

හජාජාක හා ලොසවෙඅ මේවා කවරේදැයි හඳුනාගෙන ඇතිවා පමනක් නොව ඒවායේ ඓතිහාසික වැදගත්කම ද අවධාරනය කර තිබේ. නිෂ්පාදන බලවේගයන් හා ඒවා වර්ධනය වී ඇති සමාජ සම්බන්ධතාවන් අතර අශමනීය ගැටුමෙන් හටගත් ධනේශ්වර නිෂ්පාදන විධියේ අතිමූලික ප්‍රතිසතිතාවන්, භූගෝලීයව ඒකාග්‍රිත ලෝක ආර්ථිකය හා ධනේශ්වර ජාතික රාජ්‍ය පද්ධතිය අතර ගැටුමක රූපයෙන් යලි වතාවක් මතුපිටට පැමිනෙමින් තිබේ.

එක්සත් ජනපද පාලක පැලැන්තිය මෙම ගැටුම සමනය කිරීමට අරමුනු කරන්නේ ලෝක ධනේශ්වර පද්ධතියේ අධිපති ක්‍රියාකලාපය මගින් ය. එසේ සිදුවන්නේ පරිවර්තිත තත්වයක් යටතේ ය. ගෝලීය රාජ්‍යාන්තර නායකයා වෙන කවරදාකටත් වඩා අවශ්‍යතාවක් බවට පත් කර ඇති එම භූගෝලීයකරන සන්තතිය ඒ සමග ම අවසාන විග්‍රහයේ දී අයිකෙන්බරි සහ නව පිලිවෙතේ විරුද්ධවාදීන් එතරම් ලැදියාවකින් දුන් ආපසු හැරී බලන්නා වූ "ස්වර්නමය යුගයේ" පදනම සැකසූ එක්සත් ජනපදය විටෙක භුක්තිවින්දා වූ ඉමහත් ආර්ථික ආධිපත්‍යයට යටින් වල කපයි.

මූලික ප්‍රතිවිරෝධය වන්නේ, අවශ්‍යම අවස්ථාවේ දී භූගෝලකෘත නිෂ්පාදනය හේතු කොට සිය අධිපතිත්වය පිහිටුවා ලීමේ අවශ්‍යතාවය එක්සත් ජනපද ධනවාදය විසින් ඒත්තුගෙන සිටියත්, තව දුරටත් එසේ කිරීම සඳහා ආර්ථික බලයක් එය සතුව නොතිබීම යි. දල දේශීය නිෂ්පාදිතය (දදේනි) දර්ශකයක් ලෙස ගෙන බලන්න. 1951 දී ලෝක ආර්ථිකයේ ඇමරිකානු පංගුව සියයට 27.8ක් විය. 2001 දී එය සියයට 21.4ක් විය. මෙය සියයට 24.6ක් බවට පත්ව ඇති ජපානය හැරුනුකොට ඊනියා සංවර්ධිත ආසියාවේ පංගුවට වඩා අඩු ය. කෙසේ වෙතත් එවන් පූර්න සංඛ්‍යාවන්ගෙන් සමස්ත චිත්‍රයක් හෙලි නොදැක්වේ. යුද්ධයෙන් පසුව ඇමරිකානු අධිපතිත්වය පදනම් වූයේ එය සතු වූ මහා කාර්මික ධාරිතාවය මතය. එක්සත් ජනපදය ලෝක නිෂ්පාදන ධාරිතාවෙන් සියයට 60ක් සතු කරගත් භූමියයි. අද එක්සත් ජනපදය උරුමකම් කියන වෙලඳ හා ගෙවුම් ශේෂ හිඟය පියවීමට දිනකට ඩොලර් බිලියන 3ක් පමන අවශ්‍යවේ.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org